21
JUN

# Non-Academic Vacancies (Open Recruitments) – University of Sri Jayewardenepura

21ST JUNE 2026 / UNCATEGORISED, VACANCIES

## පුරප්පාඩු

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මෙම විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් **2026.06.22 දින පෙ.ව. 8.30** සිට **2026.07.06 දින ප.ව. 4.00** දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**කළමනාකරණ සහකාර III ශ්‍රේණිය**

**සුදුසුකම් :-**

- අ.පො.ස (සා/පෙළ) විභාගයේදී

1. සිංහල භාෂාව/දෙමළ භාෂාව
2. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
3. ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06ක් එක් වරකදී සමත් වී තිබීම.

සහ

- අ.පො.ස (උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

**වැටුප් පරිමාණය :- රු. 49,475-17×540 – 58,655 (මාසික) U-MN 1(III)**

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම :-** ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**සටහන :-** යෝග්‍යතාව

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

(ඇ) මනා චරිතවත් පුද්ගලයකු විය යුතුය.

**වැඩ සහායක III ශ්‍රේණිය**

**සුදුසුකම් :**

- අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයක් (06) අවමය සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව උපරිම වාර දෙකක දී සමත් වී තිබීම.

**වෙනත්:**

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
3. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

**වැටුප් :–** රු. **42,775-16x450 – 49,975 (මාසික) U-PL 1(III)**

**බඳවා ගැනීම :–** වෘත්තීය පරීක්ෂණයක් හා/හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස :–** අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අයදුම්කරුවන් තම ඉපයීම් වලින් 10%ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර, විශ්වවිද්‍යාලය මගින් එකී ඉපයීම් වලින් 7%කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලට හා 8%කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරනු ලැබේ. එයට අමතරව 3%ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට බැර කරනු ලැබේ.

අයදුම්පත් මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ පමණක් ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත ද්වාරය (Online Portal) **2026.06.22 දින පෙ.ව. 8.30** සිට **2026.07.06 දින ප.ව. 4.00** දක්වා විවෘතව පවතිනු ඇත. වැඩි විස්තර https://www.sjp.ac.lk/vacancies වෙබ් පිටුව මගින් ලබා ගත හැකි අතර මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා https://hrms.sjp.ac.lk/vacancies/nonacademic/open වෙත පිවිසිය යුතුය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනයක / රාජ්‍ය දෙපාර්තමේන්තුවක / රාජ්‍ය සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය කරන අයදුම්කරුවන් අයදුම් කරන ලද තනතුරට තේරී පත්වුවහොත් තමා සේවය කරන ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවට වූ තම ආයතනයේ ප්‍රධානී සහතිකය අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ උඩුගත (Upload) කළ යුතුය.

සෑම අයදුම්කරුවෙකුම තමා විසින් අයදුම් කරනු ලබන සෑම තනතුරක් සඳහාම වෙන් වෙන් වශයෙන් ආපසු නොගෙවන පදනම මත **රු. 1000.00** ක අයදුම්පත් ගාස්තුවක් ගෙවිය යුතුය. මෙම ගෙවීම මාර්ගගත ක්‍රමවේදය (ණයපත් / හරපත්) මඟින් හෝ මහජන බැංකුවේ ගංගොඩවිල ශාඛාවේ අංක **097100162315454** ගිණුම බැර කර රිසිට්පත උඩුගත (**Upload**) කිරීම හෝ කළ යුතුය. එම රිසිට්පතේ ඔබගේ අයදුම්පතට අදාල ගෙවීම් යොමු අංකය (**Payment Reference No.**) සටහන් කිරීම අනිවාර්ය වේ.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම, සුදුසුකම් හා පලපුරුද්ද සනාථ කිරීම සඳහා අදාල සහතික වල පිටපත් උඩුගත (Upload) කර නොතිබීම, නියමිත අයදුම්පත් ගාස්තුව ගෙවා නොතිබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බැලීම සිදු නොකෙරේ.

**ලේඛකාධිකාරී**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.
2026.06.19